කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
දෙවන වාර පරීක්ෂණය - 2016 (ජූලි)

ඉතිහාසය

7 ශ්‍රේණිය    කාලය පැය 2 යි

- නිවැරදි පිළිතුර ලියන්න.

01. ලංකාවේ භාවිතා වූ මුල්ම කාසි විශේෂය නම් කරන්න.
02. ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක උරුම 3 ක් නම් කරන්න.
03. ලෝකයේ දුර්ලභ සංස්කෘතික උරුම ආරක්ෂා කරන සංවිධානය කුමක්ද ?
04. ස්පෘශ්‍ය උරුමයන් දෙකක් හා අස්පෘශ්‍ය උරුමයන් 2 ක් නම් කරන්න.
05. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික කලා ශිල්ප තුනක් ලියන්න.

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

06. පළමු නරසිංහවර්මන් රජුගෙන් උපකාර ලබාගත් ලාංකික රජතුමා කවුද ?
    i. දෙවන කස්සප රජු
    ii. මුගලන් කුමාරයා
    iii. මානවම්ම කුමාරයා
    iv. දෙවන දාඨෝපතිස්ස රජු

07. හතරවන උදය රජතුමා විසින් පිහිටුවන ලද ශිලා ලිපිය වන්නේ
    i. බදුලු ටැම් ලිපිය
    ii. තෝනිගල ශිලා ලිපිය
    iii. අඹගමුව ශිලා ලිපිය
    iv. දෙවනගල සෙල්ලිපිය

08. චෝළ පාලනය නිසා බිඳවැටුණු රජරට නැවත ගොඩ නැගුවේ
    i. නිශ්ශංකමල්ල රජුය
    ii. වසභ රජුය
    iii. පළමු පරාක්‍රමබාහු රජුය
    iv. පළමු විජයබාහු රජුය

09. මහා විජයබාහු රජු පිළිබඳව සඳහන්වන මූලාශ්‍රයක් වන්නේ,
    i. සංගමු විහාර ලිපිය
    ii. පනාකඩුව තඹ සන්නස
    iii. දෙවනගල සෙල්ලිපිය
    iv. ගල්පොත ශිලා ලිපිය

10. අතීතයේ පැවති හේන් හඳුන්වා ඇත්තේ
    i. නානාදේසී
    ii. පූග
    iii. පිටබිම්
    iv. අකලහස

- ගැළපෙන පිළිතුර සොයා යා කරන්න.

| | | |
|---|---|---|
| 11. | යකඩ වැඩ කරන්නන් | ශ්‍රී මාර ශ්‍රී වල්ලභ |
| 12. | වළං සාදන්නන් | ඉඳුල් කටගෑම |
| 13. | පාණ්ඩ්‍ය රජෙකි | හස්ති අධ්‍යක්ෂ |
| 14. | අති අදික යනු | කුඹල් කරුවන් |
| 15. | අන්තප්‍රාශාන යනු | ලෝකුරුවන් |

- හරි ලකුණ (✓) සහ වැරදි ලකුණ (×) යොදන්න.

16. පළමුවන සේන රජු යනු මානවම්ම පරපුරට අයත් දෙවන දප්පුල රජුගේ පුතෙකි ( )

17. මහනුවර ඇසල පෙරහැර ස්පෘශ්‍ය උරුමයකි. ( )

18. මධුපාචිකා යනු සූප ශාස්ත්‍රයෙන් දක්ෂ කාන්තාවන් නොවේ. ( )

19. රට්ඨ නම් ප්‍රදේශය පාලනය කළේ රට්ලදු නම් නිලධාරීන් විසිනි ( )

20. අතීත ලංකාවේ හොඳ මූල්‍ය කළමනාකරණයක් පැවති බව මිහින්තලේ පුවරු ලිපියෙන් හඳුනාගත හැකිය. ( )

## II - වන කොටස

උපදෙස්

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- 2, 3, 4, 5, 6 යන ප්‍රශ්නවලින් 4 ට පිළිතුරු ලියන්න.
- පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න ගණන 05 කි.

01) කෙටි පිළිතුරු සපයන්න.

1. මහා වංශය අනුව පණ්ඩුකාභය කුමරු කුඩා කළ සිටි ගම කුමක්ද?
2. දෙවන කස්සප රජුගේ පුතාගේ නම ලියන්න.
3. ක්‍රි.ව. 1164 දී බුරුමය ආක්‍රමණය කළ රජු කවුද ?
4. නිශ්ශංකමල්ල රජුගේ රාජ වංශය කුමක්ද ?
5. භාතිකාභය රජු පබළු ගෙන්වූයේ කුමන රටින් ද ?
6. ''ගෝකණ්ණ' යන ස්ථානය නූතනයේ හඳුන්වන නම ලියන්න.
7. සිගිරිය ලෝක උරුමයක් ලෙස නම් කළේ කුමන වසරේද ?
8. වෙස් මුහුණු සඳහා වඩාත් ප්‍රසිද්ධ නගරය කුමක්ද ?

(ලකුණු 1 x 16 = 16)

The National e-Learning Portal for The General Education

02)

1. ගොවිතැනෙහි ප්‍රධාන අංශ දෙක නම් කරන්න. (ලකුණු 2)
2. පහත සඳහන් බස් වහරෙහි අදහස ලියන්න.
   - නව දැලිහේන
   - ගොයම් මැඩීම
   - 
   - කිරි ගෙරි
   - අකලහස

   (ලකුණු 4)
3. අතීත ලංකාවේ පැවති ලෝක කර්මාන්තය හා අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ විස්තර කරන්න. (ලකුණු5)

03)

1. මානවම්ම පරපුරට අයත් කීර්තිමත් රජවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 2)
2. රාජ්‍ය පාලනයේ දී රජුට සහය වූ නිලධාරීන් 4 ක් නම් කරන්න. (ලකුණු 4)
3. අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලනය සිදුවූ පාලන රටා දෙක නම් කර එකක් විස්තර කරන්න. (ලකුණු5)

04)

1. ශ්‍රී ලංකාවට ආසන්න දකුණු ඉන්දීය රාජ්‍යයන් 02 ක් නම් කරන්න. (ලකුණු 2)
2. මහා විජයබාහු රජුගේ ආගමික සේවා 4 ක් ලියන්න. (ලකුණු 4)
3. මහ පැරකුම්බා රජු ගැන තොරතුරු හෙළිවන සෙල්ලිපි 02 ක් නම්කර එතුමාගේ ආර්ථික සේවාව විස්තර කරන්න. (ලකුණු 5)

100

05)

1. සංස්කෘතික උරුමයන් බෙදෙන ප්‍රධාන අංශ දෙක කුමක්ද ? (ලකුණු 2)
2. ලංකාවේ පිහිටි ලෝක උරුමයන් 4 ක් නම් කරන්න. (ලකුණු 4)
3. සීගිරියේ ඇති විශිෂ්ටත්වය කරුණු 2 ක් ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 5)

06)

1. යුනෙස්කෝ සංවිධානය හඳුන්වා දුන් අස්පෘශ්‍ය උරුම 2 ක් ලියන්න. (ලකුණු 2)
2. සාම්ප්‍රදායික කලා අංග 4 ක් නම් කරන්න. (ලකුණු 4)
3. අතීත සමාජයේ පැවති උත්සව පිළිබඳ උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 5)

The National e-learning Portal for The General Education